# දැනුම්දීමයි

**ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය සඳහා 2009 – 2019 දක්වා කාලය තුළ ලියාපදිංචි වූ සියලු සිසුන්ගේ දැනගැනීම සඳහා**

**ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය සම්පූර්ණ කර ගැනීම සඳහා සහන වාරයක් ලබා දීම**

1. රුහුණ විශ්ව විද්‍යාලයේ පශ්චාද් උපාධි පීඨය විසින් ඉදිරිපත් කරන ලද ඉහත උපාධි පාඨමාලාව සඳහා 2009 වර්ෂයේ සිට ලියාපදිංචි වී සිටි නමුත් උපාධිය සම්පූර්ණ කර ගැනීමට නොහැකි වූ අයට ඒ සඳහා සහන වාරයක් ලබා දීමට තීරණය කර තිබේ.
2. ඉහත උපාධියට ලියාපදිංචි වී මේ දක්වා උපාධිය සම්පූර්ණ කර ගැනීමට නොහැකි වූ අය ඉහත සහන වාරය තුළදී උපාධිය සම්පූර්ණ කර ගැනීමට කැමැත්තක් දක්වන්නේ නම් මෙහි දක්වා ඇති උපදෙස් අනුව ක්‍රියාකරන ලෙස දැනුම් දෙමි.
3. මේ සඳහා ලියාපදිංචිය අලුත් කිරීමේ ගාස්තුව ලෙස රුපියල් 1000.00ක මුදලක් අයකරන අතර සම්පූර්ණ කරගත යුතු එක් විෂයක් සඳහා විභාග ගාස්තු ලෙස රුපියල් 5000.00 ක මුදලක් ගෙවිය යුතුය. ඒ ඒ සිසුන් ගෙවිය යුතු විභාග ගාස්තු පිළිබඳ තොරුතුරු 041 2239146 දුරකතන අංකයට ඇමතීමෙන් ලබාගත හැකිය.
4. ඉහත උපාධිය පාඨමාලාවේ විභාග පැරණි නිර්දේශය යටතේ 2024 වර්ෂයෙන් පසුව නැවත නොපවත්වන බැවින් මෙම අවස්ථාවෙන් උපරිම ප්‍රයෝජන ලබා ගන්නා ලෙස ඉල්ලා සිටිමි.
5. මුදල් ගෙවීමේ වවුචරපත (වවුචරය භාගත කළ යුතු ආකාරය ඇමුණුම් අංක 01 මඟින් දක්වා ඇත.), ලියාපදිංචිය යාවත්කාලීන කිරීමේ අයදුම්පත හා විභාග අයදුම්පත (එක් අයදුම්පතක් පමණි) 2024.04.26 වන දින සිට 2024.05.27 දින තෙක් පශ්චාද් උපාධි අධ්‍යයන පීඨ වෙබ් අඩවියෙන් ලබා ගත හැකි අතර නියමිත ගාස්තු ගෙවා ලියාපදිංචිය යාවත්කාලීන කිරීමේ හා විභාග අයදුම් කිරීමේ අයදුම්පත පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය වෙත භාරදීමට එම කාලය තුළ හැකියාව පවතින බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

24/4/24

නියෝජ්‍ය ලේඛකාධිකාරී
පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය

නියෝජ්‍ය ලේඛකාධිකාරී
පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය
රුහුණ විශ්වවිද්‍යාලය
අංක 115, ශ්‍රී ධර්මාරාම මාවත
කොටුව - මාතර